# මුහුණට මුහුණ

## ශ්‍රීනාත් මද්දුමගේ



# විපුල් නයනානන්ද සමඟ

අද අපේ මුහුණට මුහුණ හමුවන්නේ මෙල්බන් පුරවරයේ එක රැයකින් ජනප්‍රිය වූ රංග ශිල්පියෙක් කිව්වොත් නිවැරදියි. ඔහු නමින් විපුල් නයනානන්ද. මම ඔහුට දුරකථන ඇමතුමක් දුන්නා.

**ශ්‍රීනාත්**
"විපුල් සන්නස වෙනුවෙන් ටිකක් කතා කරමුද?"

**විපුල්**
"අනේ ඉතින් මං පුංචි මිනිහෙක්නෙ...." ඔහුගේ නිහතමාණි කටහඬ ඇසුණා.

**ශ්‍රීනාත්**
"නෑ... නෑ... ඒකට කමක් නෑ... මට කියන්නකො මොකක්ද මේ මීයගෙ කතාව...?" ඔහු මහ හඬින් හිනාවුණා

**විපුල්**
මෙන්න මේකයි ශ්‍රීනාත් වුණේ... මම වේදිකාවට ආවෙ අහම්බෙන් කිව්වොත් නිවැරදියි... අපි පවුල් කීපයක් එකතු වෙලා නිවාඩු කාලෙට දවස් කීපයක විනෝද සංචාරයක යෙදෙනවා... අපි එතනදි කෑම්ප් ෆයර් එකක් කරනවා... ඒකෙදි එක එක්කෙනා ජවනිකා සින්දු ඉදිරිපත් කරනවා... මම මීයා ගැන රචනයක් කිව්වා... එදා කෑම්ප් එකට ගිය හැමෝම සතුටු වුණා... මගේ මිත්‍රයෙක් වන ජානක විජේසේකර සහ ගාමිණී රණසිංහ මේවෙලාවේ මතක් කරන්න ඕනෙ... ඒ අය එකතු වෙලා ජර්මානු කාර්මික විද්‍යාලයේ සාමාජිකයන් ඉදිරිපත් කරන ගිම්හාන රංගන ප්‍රසංගයට මම කෑම්ප් එකේදි ඉදිරිපත් කරපු කෙටි විකට වැඩසටහන ඉදිරිපත් කළා... එහිදී විශාල ප්‍රතිචාරයක් මට ලැබුණා..."

**ශ්‍රීනාත්**
"ඒ කියන්නෙ ඔබ වේදිකාවට මුලින්ම පා තැබුවේ ගිම්හාන රංගන ප්‍රසංගයෙන්...? මොනවද ඒ වෙලාවෙ හිතුනෙ?"

**විපුල්**
"මට හිතුණා කෑම්ප් එකේදි වගේ නිදහසේ මේක කරන්න බැරි වෙයි කියලා... මඩා දඩිය දැම්මා... ඒත් මං බය වුනේ නැහැ... මුහුණ දුන්නා... එදා මම හිතුවා මටත් පොඩ්ඩක් මොනවා හරි කරන්න පුලුවන් නේද කියලා... ඊට පස්සෙ ගාමිණී රණසිංහ ඔහුගේ කොන්ත්‍රාත්තුව කියන කෙටිනාට්‍යයට මාව තෝරා ගත්තා ... මම එහි ප්‍රධාන චරිතය රඟපෑවා... ඊහදීත් හොඳ ප්‍රතිචාරයක් ලැබුණා... ගාමිණී තමයි මට මුලින්ම වේදිකාවේ හැසිරෙන හැටි ඉගැන්නුවෙ... ඊට පස්සෙ එම කෙටි නාට්‍යය දැකපු මාලිනී ජයසිංහ මහත්මිය මාව මහාසාර නාට්‍යයට තෝරා ගත්තා... එහිදී ජය ශ්‍රී චන්ද්‍රජිත් මහතා යටතේ පුහුණුවීම් කරන කාලේ හුඟාක් දේ ඉගෙන ගත්තා... ඔබෙනුත් යම් යම් දේ ඉගෙන ගත්ත හැටි මට තාම මතකයි... මේ වෙලාවෙ මේ සියලු දෙනා ආදරෙන් මතක් කරන්න ඕනෙ.."

**ශ්‍රීනාත්**
"ඔබ අපූරු චරිතයක් රඟ පෑ කැළණි පාලම නාට්‍යය ගැන යමක් කියන්න..."

**විපුල්**
"මම කවදාවත් හිතුවෙ නෑ එදිරිවීර සරච්චන්ද්‍රයන්ගෙ මහාසාර නාට්‍යය හා ආර් ආර් සමරකෝන් මහතා වැනි ප්‍රවීණයන්ගෙ නාට්‍යයක රඟපාන්න අවස්ථාවක් ලැබෙයි කියලා... ඒකත් වුණේ අහම්බෙන්... මහාසාර නාට්‍යය බලන්න ආපු බිනර ධර්මවර්ධන හා ඔහුගේ මව ධර්මවර්ධන මහත්මිය මාව කැළණි පාලමටතොරාගන්න කියලා කියලා තියෙනවා... එහෙමයි කැළණි පාලමට සම්බන්ධ වුණේ...

**ශ්‍රීනාත්**
පාසලේදි ඔබ රංගනයට සම්බන්ධ වුණේ නැද්ද...

**විපුල්**
නෑ... මං පාසලේදි කළේ ක්‍රිකට් ගහපු එක...

**ශ්‍රීනාත්**
ඒ කියන්නෙ ඔබ හොඳ ක්‍රිකට් ක්‍රීඩකයෙක්...?

**විපුල්**
ටිකක් ගැහුවා...

**ශ්‍රීනාත්**
පළමු පෙළ ක්‍රිඩකයෙක් ද?

**විපුල්**
ඔව්... බෝලින් බැටින් දෙකම හොඳයි...

**ශ්‍රීනාත්**
පාසල?

**විපුල්**
සෙන්ට් ජෝන්ස් නුගේගොඩ... මේ වෙලාවෙ පාසල ඉතාමත් ආදරයෙන් මතක් කරන්න ඕනෙ... අප හොඳ පුරවැසියන් කරන්න මග පෙන්නුවෙ පාසලයි...

**ශ්‍රීනාත්**
කාර්මික විද්‍යාලයට ඇතුල් වුණේ කොහොමද...? ගෙදරින් බල කලා ද?

**විපුල්**
නෑ... ගෙදරින් කිසි දෙයක් කිව්වෙ නැහැ... මමම හිතලා අයැදුම්පතක් දාලා කාර්මික විද්‍යාලයට ඇතුල් වුණා... එහි ප්‍රතිඵලයක් හැටියට 1992 දී ඔස්ට්‍රේලියාවට ආවා...

**ශ්‍රීනාත්**
පවුලේ විස්තර ටිකක් කියමුද?

**විපුල්**
මගේ තාත්තා නැති වෙලා... අම්මා ඉන්නවා... අයියා ඉන්නවා... ඔහු ඉන්නෙ ඉතාලියෙ... අක්කා ඉන්නවා... මේ අය සේරම විවාහ වෙලා... දරුමල්ලෙ ඉන්නවා...

**ශ්‍රීනාත්**
කොහොමද කලාවට බිරින්දෑගේ සහයෝගය?

**විපුල්**
කියලා වැඩක් නෑ... මුළදි නම් පොඩ්ඩක්වත් කැමති වුණේ නැහැ මේවට යනවට... දැන් නම් පූර්ණ සහයෝගය දෙනවා...

**ශ්‍රීනාත්**
ඇගේ නම?

**විපුල්**
මජුලා විජේසිංහ... දරුවන් දෙන්නෙකුත් ඉන්නවා... දුව නටාෂා සම්මානි... පුතා තුසල් මියුරංග...

**ශ්‍රීනාත්**
මේ අයව කලාවට සාහිත්‍යයට යොමු කරන්න අදහසක් නැද්ද?

**විපුල්**
ඇයි නැත්තෙ? මගේ බලාපොරොත්තුව මගේ දරුවන් අධ්‍යාපනයට වගේම කලාව සාහිත්‍යයටත් යොමු කරන්න...

**ශ්‍රීනාත්**
එහෙමනම් අප එක්ක මේ පිළිසඳරට එක්වුණාට ස්තූතියි...

**විපුල්**
සන්නසටත් ස්තූතියි... ඒ වගේම මගේ කලා හැකියාවන් වර්ධනය කරගන්නට අත හිත දුන් හැම දෙනාටමත් නම් වශයෙන් මතක් නොකළාට අමනාප වෙන්න එපා... විශේෂයෙන් ජර්මානු කාර්මික විද්‍යාලයේ සියලු සහෘදයන්ටත් ජනක ගාමිණී රණසිංහ මලිනී ජයසිංහ ශ්‍යාමෙන් ජයසිංහ ජයශ්‍රී චන්ද්‍රජිත් මහත්වරුන්ටත්ස්තූතියි ...

ලිපිනය
11 Templewood Court
Perwic Vic

---

අද සැබෑ වි ඇති

# කොසොල් රජු දුටු සිහින (1 කොටස)

ස්විඩන් ස්ටොක්හොල්ම් බෞද්ධ විහාරවාසී

**පූජ්‍ය මාරතුගොඩ උපරතන හිමියන්**

විසිනි.

**එක් දිනක්** කොසොල් රජු රාත්‍රියේ නින්දට ගොස් අලුයම් කල භයානක සිහින 16 දැක බියෙන් තැතිගෙන අවදිවී මෙයින් මා හට අණතුරක් සිදුවේදොයි සිතමින් නොනිදා රැය පහන් කළහ. උදැසන පුරෝහිතයන් කැඳවා සිහින විස්තර කළ රජු එයින් තමාට යම් අන්තරායක් වේදැයි විමසීය. ලාභ සත්කාරයන්ට ගිජු බමුණන් මහරජ සිහින ඉතා කර්කශය. භයානකය. මෙයින් රාජ්‍යයට හෝ භව භෝග යනට හෝ ඔබවහන්සේට අනර්තයක්ම වන්නේය. ඔබ වහන්සේගේ ජීවිතය ආරක්ෂා කරගැනීම සඳහා වහා යාගයක් කළ යුතුයයි දන්වා සිටී. රජ අණින් යාගය සුදානම්වේ.

මෙය දකින මල්ලිකා දේවිය මහරජ බමුණෝ කුමක් දන්නේද ඔවුන් ලාභ සත්කාරයන්ටම ලොල්ය. ආත්මාර්ථ කාමිහුය. අමාමෑණී අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දෙව්රම වැඩ වසති. උන්වහන්සේ සිහින වල තොරතුරු දන්නාසේක. වැඩිය මැනවැයි කිවුය.

රජු බියෙන් සහ කනස්සල්ලෙන් බුදුරදුන් හමුවට පැමිණ දුටු සිහින එලෙසින්ම සැලකරසිටී. එය අසාසිටි අමාමෑණී බුදු පියාණන් වහන්සේ මහරජ බිය නොවන්න ඒවායේ ඵල විපාක දැන් නොව මතු අනාගතයට සිදුවනබව වදාරා එක් එක් සිහිනය තෝරා දෙමින් රජු අස්වසාලීය. මහා සුපින ජාතකයෙහි එම සිහින 16 කොසොල් රජු ඉදිරිපත් කළ අන්දම සහ බුදුරදුන් එය තෝරාදුන් ආකාරය මෙසේ සඳහන් වේ.

**පලමුවන සිහිනය**

ස්වාමිනි මා පළමුවන සිහිනය මෙසේ දුටිමි. ගොණුන් සිව් දෙනෙක් සටන් කිරීම සඳහා ගර්ජනා කරමින් සතර දිසාවෙන් රාජාංගනයට අවුත් සටන් නොකරම යලිත් ගර්ජනා කරමින් ඒ ඒ අත පලා ගියහ.

**තේරුම**

මහ රජ මෙහි විපාක තොප සමයේත් අප සමයේත් නොවන්නේය. මෙහි විපාක අනාගතයෙහිම වන්නේය. අනාගතයේ අධාර්මිෂ්ඨ රජවරු සහ මිනිසුන් ලොව පහලවෙති. ඔවුන් කුසල් නොකර අකුසල් කරති.එවිට ලොව පිරිහේ. කලට වැසි නොවසි. වැසි ජලය සිඳේ.භෝග ආදිය මලානික වේ. ගර්ජනා කරමින් එන ගොණුන් සටන් නොකර පලා යන්නා සේ සිව් දිසාවෙන් එන මේඝයෝ වැසි නොවැසම ආපසු පලා යයි.

**දෙවන සිහිනය**

ස්වාමිනි වියතක් රියනක් උසැති ඉතා ළාබාල පොඩි පැල වල ගෙඩි සහ මල් හටගෙන ඇති ආකාරයද සිහිනෙන් දුටුවෙමි.

**තේරුම**

මහරජ මෙහි ප්‍රතිඵල ද අනාගතයටම වන්නේය. එකල සත්වයෝ අධික රාගයෙන් පෙළෙමින් සමාජ සම්මත සිරිත් විරිත් නොසලකා හරිමින් ළපටි පැල වල ගෙඩි මල් හටගන්නා සේ ඉතා ළාබාල වියේ පසුවන කුමාරිකාවන් විවාහ කරගනිමින් දූ දරුවන්ද ඇති කරමින් ජීවත්වෙති.

**තෙවන සිහිනය**

ස්වාමිනි එදවස උපන් වසු පැටියන්ගෙන් මහ දෙනුන් කිරි උරා සබොන්නා දුටිමි.

**තේරුම**

මහරජ මෙබඳු පුදුම සහගත දේ අද නොව මත්තට සිදුවේ. මතු කල පහලවන සත්වයෝ මව් පියන් නැදි මයිලන් මහණ බමුණන් වැඩි හිටියන් කෙරෙහි කිසිදු සැළකිල්ලක් ගරු සරුවක් නොකරති. නොසලකතිදූ දරු සෙනෙහසක් නොලබන බොහෝ දෙමාපියන් කර කියාගත කිසිත් නොමැතිව ජීවත්විමට අපහසුවී එදවස උපන් වසුපැටියන්ගෙන් කිරි බොන මහ දෙණුන් මෙන් දරුවන්ට යටත්ව ජීවත්විමට සිදුවේ.

**සතරවන සිහිනය .**

ස්වාමිනි ආරෝහ පරිනාහ සම්පන්නවු ඉතා ශක්තිමත් ගොණුන් සිටියදීත් දුබල වුත් අලස වුත් ගොණුන් බැඳි කරත්ත වලින් වෙළදාමේ ගොස් අසාර්ථකව ආපසු පැමිණි වෙළඳ කණ්ඩායමක් සිව්වන සිහිනයෙන් දුටුවෙමි.

**තේරුම**

මහරජ අනාගතයේ අධාර්මිෂ්ඨ මෝඩ පාලකයෝ පහලවෙති. ඔවුන් නුවණැත්තන්ට ගරහති. ඊර්සියා කරති. නුවණැත්තනට නිසි තනතුරු නොදෙති. නුසුදුස්සන්ටම තනතුරු පිරිනමති. ඔවුන්ටම තීරණ ගැනීමට ඉඩ හරිති. කිසිත් නොදන්නා ඔවුන්ටම තනතුර බරක් වෙති. තනතුරේ ගෞරවයද පිරිහෙති. දුබල ගොණුන් බැඳි ගැල් වලින් ගොස් අසාර්ථකව පැමිණි වෙළඳ කණ්ඩායම මෙන් රට පිරිහේ. පාලනය අසාර්ථක වේ.

**මතු සම්බන්ධයි**

## කවි කොළය

මානව දයා ගුණයක් අහලවත් නැති
කොටි හපුවෙකුව ඇපලෝ රෝහලට ගෙනැත්
විමසා බලන විට හදවත ඇතුලෙ තතු
ස්කෑනයෙන් ආවලු කවියක් මෙහෙම

අලගියවන්න මහ කිවිඳුන් සුභාෂිතේ
ලිව්වෙත් මෙහෙව් රටකද අම්මාපල්ල
කූණු කූඩයෙන් වත් අරගෙන බලපල්ලා
නපුරු ඳුදනන්ගෙ සියොළගෙහිම විසය

වෙත්තසිංහ